# බමුණු චින්තනය

නිව්ටෝනීය සුසමාදර්ශයෙහි ඇති තවත් ප්‍රධාන කරුණු කිහිපයක් ගැන කතා කරන්නට පෙර ලෝකයේ එතෙක් මෙතෙක් සිදු වී ඇති ඉහළම චින්තන විප්ලවය ගැන යමක් කිව යුතු ය. ඒ බුදුන් වහන්සේ විසින් සිදු කරන ලද චින්තන විප්ලවය ය. චින්තනය යන්න සුසමාදර්ශයට වඩා පළල් ය. එක් චින්තනයක් තුළ සුසමාදර්ශ එකකට වඩා තිබිය හැකි ය. බටහිර විද්‍යාව පදනම් වී ඇත්තේ බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයෙහි ය. මේ චින්තනය විසින් බටහිර නූතනත්වය හා ඒ සමග ඇති වූ හෝ ඒ ආශ්‍රිත ව ඇති වූ ධනවාදය, බටහිර යටත්විජිතවාදය, බටහිර විද්‍යාව ආදිය පමණක් නොව මාක්ස්වාදය ද බිහි කෙරිණි. බටහිර යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයෙහි ප්‍රධාන ම සුසමාදර්ශය වූයේ හා වන්නේ නිව්ටෝනීය සුසමාදර්ශය ය. නිව්ටෝනීය සුසමාදර්ශයට අමතර ව එහි අයින්ස්ටයිනීය සුසමාදර්ශය වෙයි. එහෙත් තාප ගතික සුසමාදර්ශය හා ක්වොන්ටම් සුසමාදර්ශය යුදෙව් ග්‍රීක ක්‍රිස්තියානි චින්තනයට බාහිර වෙයි.

බුදුන් වහන්සේ සිදු කෙළේ සුසමාදර්ශ වෙනසක් නොවේ. එය චින්තන වෙනසක් නැත්නම් චින්තන විප්ලවයක් විය. සිදුහත් කුමරු ඉපදුණේ ආර්‍ය සමාජයක නොවේ. ආර්‍යයෝ මෙයට අවුරුදු තුන්දහස් පන්සියයකට පමණ පෙර බටහිරින් භාරතයට පැමිණියෝ ය. ඔවුන් භාරතයට පැමිණෙන විට එහි සිටියෝ පොදුවේ අනාර්‍යයෝ නමින් හැඳින්වෙති. මේ අනාර්‍යයන් අතර විවිධ ගෝත්‍රිකයෝ සිටියහ. මෙහි දී දෙමළ ජාතිවාදීන් විසින් කෙරෙන මුළා කිරීමක් ගැන අපි අවබෝධයෙන් සිටිය යුතු වෙමු. අද වන විට දෙමළ ද එක් ජනවර්ගයක් වූ ද්‍රවිඩයන් පළමුවෙන් ම භාරතයට පැමිණියේ ආර්‍යයන් භාරතයට පැමිණීමෙන් පසුව ය. ද්‍රවිඩයන් භාරතයට පැමිණ ඇත්තේ මෙයට අවුරුදු දෙදහස් පන්සියයකට පමණ පෙර බටහිර ආසියාවෙනි. පරණවිතාන විද්වතා මෙන් ම ද්‍රවිඩ ඉතිහාසඥයන් වූ නීලකණ්ඨ ශාස්ත්‍රී පඬිවරයා වැන්නන් ද මේ බව හෙළි කර ඇත. ද්‍රවිඩයන් භාරතයට සංක්‍රමණය වී ඇත්තේ දැන් පකිස්ථානය නමින් හැඳින්වෙන රට අසළින් ය. අද ද පකිස්ථානයට නුදුරු බ්‍රැහි නම් කුඩා ප්‍රදේශයක ජීවත්වන්නෝ ද්‍රවිඩ භාෂාවක් කතා කරති. (දෙමළ යනු එක් ද්‍රවිඩ භාෂාවක් පමණක් වෙයි. මලයාලම්, කණ්ණඩ, තෙළිඟු ආදී වෙනත් ද්‍රවිඩ භාෂා ද වෙයි.) ඇතැම් ඉතිහාසඥයන් දරණ මතයට අනුව ද්‍රවිඩයන් බටහිර ආසියාවේ සිට භාරතයට පැමිණීමේ දී නැවතුණු ස්ථානවලින් එකක් වී ඇත්තේ අද බ්‍රැහි නමින් හැඳින්වෙන ප්‍රදේශය ය.

දෙමළ ජාතිවාදීන් හා ඔවුන් අනුකරනය කරන්නන්ට අනුව නම් ආර්‍යයන් පැමිණීමට පෙර භාරතයේ වාසය කළෝ ද්‍රවිඩයෝ ය. ඔවුන්ට අනුව මොහෙන්ජදාරෝ හරප්පා ශිෂ්ටාචාරය ද ගොඩ නගා ඇත්තේ ද්‍රවිඩයන් ය. මොහෙන්ජදාරෝ හරප්පා ශිෂ්ටාචාරයෙහි වූ ඇතැම් දෑ ද්‍රවිඩ සංස්කෘතියෙහි ද තිබීම මේ නිගමනය සඳහා ඔවුන්ට ඇති එකම සාධකය වෙයි. විශේෂයෙන් ම ද්‍රවිඩ සංස්කෘතිය මාතෘ මූලික වීම මෙහි දී ගෙන හැර දැක්වෙයි. එහෙත් මෙය ඉතා ළාමක තර්කයකි. බොහෝ පැරණි සමාජ මාතෘ මූලික විය. පීතෘ මූලික සමාජ ඇති වූයේ ඉතිහාසයේ බොහෝ කලකට පසුව ය. ද්‍රවිඩ සංස්කෘතිය පැරණි සංස්කෘතියක් විය හැකි ය. එබැවින් එහි මාතෘ මූලික ලක්‍ෂණ තවමත් තිබෙන්නට ද හැකි ය. මෙහි දී කිව යුතු කරුණක් නම් සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ද මාතෘ මූලික ලක්‍ෂණ ඇති බව ය. අනෙක් අතට ද්‍රවිඩයන් භාරතයට සංක්‍රමණය වීමෙන් පසුව එහි සංස්කෘතියෙහි එවකටත් තිබූ ඇතැම් මොහෙන්ජදාරෝ හරප්පා ලක්‍ෂණ අවශෝෂණය කර ගත්තා විය හැකි ය. එබැවින් මොහෙන්ජදාරෝ හරප්පා ශිෂ්ටාචාරයෙහි ඇතැම් ලක්‍ෂණ ද්‍රවිඩ සංස්කෘතියෙහි තිබූ පමණින් මොහෙන්ජදාරෝ හරප්පා යනු ද්‍රවිඩ සංස්කෘතියක් යැයි නිගමනය කිරීමට නොහැකි ය.

ආර්‍යයෝ භාරතයට වෙනත් ම චින්තනයක් ගෙන ආවෝ ය. ඔවුන් පැමිණෙන විට භාරතයෙහි තිබූ චින්තනය අනාර්‍ය චින්තනය හෙවත් පැරණි, එනම් ප්‍රාග් වෛදික චින්තනය යැයි නම් කරමු. මේ චින්තනය විසින් බුදුන් වහන්සේට පෙර ම සංසාරය, කර්මය, විමුක්තිය ආදී සංකල්ප ආශ්‍රිත දැනුමක් ගොඩ නගා තිබුණි. පැහැදිලිව ම එය චක්‍රීය චින්තනයක් විය. භාරතීය විද්‍යාවන් චක්‍රීය චින්තනයක් මත ගොඩ නැගුණේ වෙයි. සංසාරය පිළිබඳ අදහස නිර්මාණය විය හැක්කේ ඉතා දියුණු චක්‍රීය චින්තනයක ය. භාරතයට පැමිණි ආර්‍යයෝ දේව සංකල්ප ද රැගෙන ආවෝ ය. මේ ආර්‍ය දෙවිවරු ඉරාණ සංස්කෘතියෙහි ද වූහ. ඉරාණය හෙවත් පර්සියාව ආර්‍යයන් වාසය කළ පැරණිම ප්‍රදේශයක් විය. ආර්‍යයන්ගේ දෙවිවරු ග්‍රීක දෙවිවරුන්ගෙන් ද වෙනස් නොවූහ. මධ්‍යධරණී ප්‍රදේශවල බිහි විණි යැයි සිතිය හැකි

© Prof. Nalin De Silva

මේ දෙවිවරු මිනිසුන්ගෙන් හා ලෝකයෙන් වෙන් වූ යුදෙව් යෙහෝවා දෙවියන් වහන්සේ වැන්නෙක් නොවී ය. ග්‍රීක දෙවිවරුන් ගැන කලින් සඳහන් කර ඇත.

භාරතයට පැමිණි ආර්යයන්ට එතරම් දියුණු චින්තනයක් නොවී ය. ඔවුහු යුද්ධයෙහි හා අසුන් පිට යෑමෙහි දක්‍ෂයෝ වූහ. ඔවුන් භාරතය යටත් කෙළේ දේශපාලනික ව ය. භාරතයට සංක්‍රමණය වූ ආර්යයන්ගේ පැතිර යෑම මහා භාරතය නම් කෘතියෙහි දැක්වෙයි. මේ පැතිර යෑම ආර්යයන් පෞද්ගලික ව භාරතයේ විසිරී යෑමකට වඩා ආර්ය සංස්කෘතිය පැතිර යෑමක් විය. මෙසේ පැතිර ගිය සංස්කෘතිය හුදු ආර්ය සංස්කෘතියක් නොවී ය. එය ආර්ය සංස්කෘතියෙහි මෙන් ම එවකට භාරතයෙහි තිබූ ප්‍රාග් වෛදික සංස්කෘතියෙහි ද සංයෝගයක් විය. කලක් ගතවීමෙන් පසු භාරතය පුරා පැතිර ගියේ සංයෝගයක් වූ මේ සංස්කෘතිය ය. රාමායණයෙහි සඳහන් වන පුවතින් මේ බව වඩාත් තහවුරු වෙයි. මහා භාරතයෙහි ආර්ය සංස්කෘතිය පැතිර යෑම ගැන කියැවෙන්නේ නම් රාමායණයෙහි ප්‍රකාශ වන්නේ සංයෝග සංස්කෘතිය අනාර්ය ගෝත්‍රිකයන්, විශේෂයෙන් ම දකුණේ ජීවත් වූවන් කරා පැතිර ගිය ආකාරය ය. රාමායණයෙහි සඳහන් වන අගස්ති සෘෂිවරයා මේ සංයෝගයට හොඳ ම උදාහරණය වෙයි.

භාරතයට ආර්යයන් වයඹ දෙසින් ගෙන ආ ආර්ය සංස්කෘතිය  උතුරු භාරතයේ, එනම් දළ වශයෙන් ගතහොත් වින්ධ්‍යා කඳු වැටියට උතුරු දෙසින් වූ භූමියෙහි, බටහිර සිට නැගෙනහිරට, අද නම් කෙරී ඇති අයුරින් නම් මහාරාෂ්ට්‍රයේ හා ගුජරාටයේ සිට බෙංගාලයට (පැරණි වංගය) හා ඔරිස්සාවට (පැරණි කාලිංගය), පැතිර යෑමේ දී මේ සංයෝග සංස්කෘතිය බිහිවිණි. පසුව භාරතයේ දකුණටත් විජයගෙන් සංකේතවත්වන ගමනින් ලංකාවටත් පැමිණියේ මේ සංයෝග සංස්කෘතිය ය. මේ සංයෝග සංස්කෘතිය යනු අන් කිසිවක් නොව වෛදික සංස්කෘතිය වෙයි. වෛදික සංස්කෘතිය බිහි වූයේ චින්තන විප්ලවයක් ද සමගින් ය. ආත්මය, පරමාත්මය, බ්‍රහ්මන් වැනි සංකල්ප පමණක් නොව භාරතීය වර්ණ භේදය ද මේ චින්තන විප්ලවය තුළින් ඇති වූ දෑ ය. මේ චින්තනයට අපි වෛදික චින්තනය යැයි කියමු. පීතෘ මූලික සමාජය භාරතයේ බිහිවන්නට ඇත්තේ ද මේ වෛදික චින්තනයේ ප්‍රතිඵලයක් නිසා විය හැකි ය.

වෛදික චින්තනය තුළ දේශපාලනයේ දී රජුන්, එනම් ක්‍ෂත්‍රියයන් ප්‍රධාන වූ ආකාරයට සංස්කෘතික ක්‍ෂෙත්‍රයෙහි බමුණෝ පෙරට පැමිණියහ. ආගම මෙන් ම අධ්‍යාපනය ද සංස්කෘතියෙහි කොටසක් විය. මේ සියල්ලෙහි දී ප්‍රධානත්වය ගත්තෝ බමුණෝ විය. බමුණෝ ක්‍ෂත්‍රියයන්ගේ අනුශාසකයෝ ද වූහ. එබැවින් වෛදික චින්තනයෙහි බමුණන් දැරූ විශේෂත්වය සිතා ගත හැකි ය. දේශපාලනය හා සංස්කෘතිය මෙන් ම වැදගත් තැනක් ගන්නා අනෙක් ක්‍ෂෙත්‍රය වූයේ ආර්ථිකය ය. කාල් මාක්ස් පඬිවරයා ආර්ථිකය අනෙක් ක්‍ෂෙත්‍ර දෙකෙන් වෙන් කර උසස් තලයකට තල්ලු කර අනෙක් ක්‍ෂෙත්‍ර ද ආර්ථිකයෙන් නිර්ණය කෙරෙන බව පෙන්වීමට අසාර්ථක උත්සාහයක් ගත් බව ද මාක්ස්වාදයෙහි හරය සියල්ල ආර්ථිකයට ඌනනය කෙරෙන ප්‍රවාද මත රැඳී ඇති බව ද අමතක නොකළ යුතු ය. දේශපාලනය, සංස්කෘතිය හා ආර්ථිකය යනු එකක් අනෙක් ඒවා මත යැපෙන ක්‍ෂෙත්‍ර බවත්, එක් ක්‍ෂෙත්‍රයකට අනෙක් ක්‍ෂෙත්‍ර දෙක ඌනනය නොකළ හැකි බවත්, ඒ ක්‍ෂෙත්‍ර අතර ඇත්තේ අන්‍යෝන්‍ය සම්බන්ධයක් බවත්, ඒවා අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර නොවන ක්‍ෂෙත්‍ර බවත් අමතක නොකළ යුතු ය. ඒ ක්‍ෂෙත්‍ර අතර ඇති සම්බන්ධය එලෙස ගත් කල චක්‍රීය වෙයි. එවැනි චක්‍රීය සම්බන්ධයක් නිර්මාණය කර ගත හැක්කේ චක්‍රීය චින්තනයක ය. මාක්ස්වාදයට එවැනි සම්බන්ධයක් ගොඩ නගා ගත නොහැකි වෙයි. මාක්ස්වාදය පදනම් වන්නේ ඒක රේඛීය චින්තනයක ය. ඒක රේඛීය චින්තනයක් තුළ සියල්ල එකකට ඌනනය වෙයි.

එකල භාරතයේ තිබුණේ කෘෂි ආර්ථිකයකි. එයට අමතර ව වෙළෙන්දෝ ද වූහ. වඩා සාර්ථක වෙළෙන්දෝ සිටුවරු වූහ. ආර්ථිකයෙහි ප්‍රධාන තැනක් ගත්තෝ වෛශ්‍යයෝ වූහ. සෙසු සියල්ලෝ ශූද්‍රයෝ වූහ. මේ මුල දී වර්ණ භේදයක් විය. භාරතයට පැමිණි ආර්යයෝ සුදු පැහැයෙන් යුක්ත වූහ. අනාර්යයෝ දුඹුරු කහ ආදී පැහැයෙන් යුක්ත වූහ. සමාජය එසේ වර්ණය මත පදනම් ව කොටස්වලට කැඩීමේ දී ආරම්භක බමුණෝ අනාර්යයන් ශූද්‍රයන් ලෙස වර්ග කළහ. පසුව ඇතැම් අනාර්යයන් ද ක්‍ෂත්‍රිය හා වෛශ්‍ය කුලවලට ඇතුල් කර ඇති බව පෙනෙයි. කෙසේ වෙතත් මෙලෙස ඇතුල් කර ගනු ලැබූ අනාර්යයන් වෛදික සංස්කෘතික ආධිපත්‍යය පිළිගත්තවුන් බවට සැකයක් නැත. භාරතීය කුල භේදය වර්ණ භේදයක් ලෙස හැඳින්වෙන්නේ එහි ඓතිහාසික සම්භවය හේතු කොට ගෙන ය.

© Prof. Nalin De Silva

භාරතීය වෛදික චින්තනය තුළ හා ඒ මත පදනම් වූ වෛදික සමාජයෙහි දැනුම නිර්මාණය කළෝ බමුණෝ වූහ. බ්‍රහ්මන්, මායාව, ආත්මය, පරමාත්මය, විමුක්තිය ආදී සංකල්ප හා ඒ ආශ්‍රිත දැනුම් බමුණන්ගේ නිර්මාණ විය. බමුණෝ දක්ෂයෝ වූහ. ඔවුහු ඉහළ ම බුද්ධිමත්තු වූහ. ඔවුන්ගේ මොන දුර්වලකම් තිබුණ ද, අප ඔවුන් සමග එකඟ නොවුණ ද ඒ බව පිළිගත යුතු ය. අද බටහිර විශ්ව විද්‍යාලවල හා පර්යේෂණ ආයතනවල දැනුම නිර්මාණය කරන්නෝ ද ඉහළ ම ගණයේ දක්ෂ බුද්ධිමත්තු වෙති. බමුණන් වෛදික චින්තනය තුළ දැනුම නිර්මාණය කළ පරිදි අද බටහිර බුද්ධිමත්තු ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තුළ දැනුම නිර්මාණය කරති.

බටහිරයන් නූතනත්වය ආරම්භයේ දී ග්‍රීක, යුදෙව් හා ක්‍රිස්තියානි චින්තනවල සංයෝගයකින් නවතම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයක් නිර්මාණය කළ ආකාරයට භාරතීය බමුණෝ ද ආර්ය හා අනාර්ය චින්තන සංයෝගයෙන් වෛදික චින්තනය නිර්මාණය කළහ. ඉරානයේ සිට ගෙන ආ බහු දේවවාදය භාරතයේ දී සංසාරය හා කර්මය සමග මුසු වී ඒක දේවවාදයක් බවට පත් කරනු ලැබිණි. සියල්ල බ්‍රහ්මන් නම් සංකල්පය වටා බැඳුණි. බ්‍රහ්මන් පරමාත්මය වෙයි. අපි ද, එනම් මිනිසුන් ඇතුළු සෙසු සත්තු, පරමාත්මයේ ම කොටස් වෙමු. එහෙත් මේ ඒකත්වය අපට නොපෙනෙන්නේ මායාව හේතුකොටගෙන ය. මායාව නිසා අපි එක එකා එකිනෙකාගෙන් හා බ්‍රහ්මන්ගෙන් වෙන් වුවන් ලෙස සලකමු. බෞද්ධයන් ද යොදා ගන්නා වචනයක් වනුයේ පෘථග්ජන යන්න ය. පෘථග්ජනයා යන්නෙහි තේරුම වෙන් වූ තැනැත්තා යන්න ය. වෛදික බමුණන්ට අනුව අප වෙන් වී ඇත්තේ මායාව නිසා හට ගන්නා වැරදි වැටහීමෙන් ය. මේ වැරදි වැටහීම, එනම් පරමාත්මය වූ බ්‍රහ්මන්ගෙන් වෙන් වී ඇති බව වැටහීම, නිසා අපේ කුඩා ආත්ම සංසාරයේ සැරිසරයි. බමුණන්ට අනුව සංසාරයෙන් එගොඩ වී විමුක්තිය අත්පත් කර ගත හැක්කේ මායාව නැති කර බ්‍රහ්මන් සමග එකතු වීමෙනි. බ්‍රහ්මන් සමග එකතු වූ විට සංසාර ගමන කෙළවර වන බව බමුණන්ගේ අදහස විය. පසු කාලීන වර්ධනයන් තුළ විශේෂයෙන් ම අද්වෛත වේදාන්තයෙහි මේ අදහස් සංශෝධනය වෙයි. අද්වෛත වේදාන්තයට බුදු දහමෙහි බලපෑම ඇති බව පැහැදිලි ය. එහි දී බ්‍රහ්මන් සංකල්පය ඉතා සියුම් ලෙස විශ්ලේෂණය වෙයි. බ්‍රහ්මන් නිවණ වැනි, එහෙත් පවත්නා තත්ත්වයකට පත් කෙරෙයි. බ්‍රහ්මන් එහි දී නිර්ගුණ, එනම් සංකල්පීය ව කිව හැකි ගුණයකින් තොර වන අතර සියල්ල බ්‍රහ්මන් හා බ්‍රහ්මන් පමණක් ම වෙයි. බ්‍රහ්මන්ගෙන් බාහිර වූ යමක් නැත. බ්‍රහ්මන් සමග එකතු වීම වැනි සංකල්පයක් වුව ද අද්වෛත වේදාන්තය ප්‍රතික්ෂේප කරයි. එයට හේතුව බ්‍රහ්මන් සමග එකතු වන්නේ යැයි කී විට බ්‍රහ්මන්ගෙන් බාහිර ව එසේ එකතු වන්නකු ගැන කියැවෙන හෙයිනි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva